# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 405 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 08/03/2024<br>පැය 0935 |

# මාධ්‍ය නිවේදනය

**01. රන් පැහැති කඩුවක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කතරගම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.03.07 වන දින සවස් කාලයේ ලුණුගම්වෙහෙර පොලිස් වසමේදී කතරගම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **රන් පැහැති කැබ් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි** පුද්ගලයෙකු එම කඩුව හා කැබ් රථය සමඟ අත්අඩංගුවට ගෙන ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 62 ක් වන දික්වැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. වාලම්පුරියක් සමඟ හිමිනමක් ඇතුළු සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කල්ලඩි පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.03.07 වන දින දහවල් කාලයේ කල්කුඩා පොලිස් වසමේ පාසිකුඩා ප්‍රදේශයේදී කල්ලඩි පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **වාලම්පුරියක් මුදලට අලෙවි කිරීමට සූදානමින් සිටි** හිමිනමක් හා සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කල්කුඩා පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් හිමිනම පන්නිපිටිය, මහරගම ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩ වාසය කරන හිමි නමක් වන අතර සැකකරු වයස අවුරුදු 31 ක් වන අකුරැස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කල්කුඩා පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ධීවර කටයුතු සඳහා පිටව ගිය ධීවරයින් තිදෙනෙකු රැගත් බෝට්ටුවක් නැවත නොපැමිණීම - කල්පිටිය පොලිස් ස්ථානය.**

2024.03.06 වන දින දහවල් කාලයේදී කල්පිටිය පොලිස් වසමෙන් ධීවර කටයුතු සඳහා පිටව ගිය බෝට්ටුවක් නැවත ගොඩ බිමට නොපැමිණි බවට කල්පිටිය පොලිස් ස්ථානය

වෙත එම බෝට්ටුවේ හිමිකරු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව කල්පිටිය පොලිසිය මඟින් විමර්ශනයක් ආරම්භකර ඇත.

**මෙලෙස ධීවර කටයුතු සඳහා පිටව ගිය බෝට්ටුවේ ධීවරයින් තිදෙනෙකු සිට ඇති අතර ඔවුන් අවුරුදු 21,37 හා 38 වයස් වල පසුවන ඊච්චන්කාඩුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මේ සම්බන්ධව කල්පිටිය නාවික හමුදා කඳවුරද දැනුවත් කර ඇති අතර සෝදිසි කටයුතු සිදුකරමින් පවතී. කල්පිටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**